ශ්‍රී සුමංගල විද්‍යාලය - පානදුර Sri Sumangala College – Panadura ශ්‍රී සුමංගල විද්‍යාලය - පානදුර Sri Sumangala College – Panadura

**ශ්‍රී සුමංගල විද්‍යාලය - පානදුර**

**Sri Sumangala College – Panadura**

**ඉතිහාසය I**
**History I**

**කාලය පැය තුනයි.**

නම / අංකය : ..........................................................................

**10 ශ්‍රේණිය**

## I කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

1. මහා වංශයේ මුල් කොටස රචනා කළ මහානාම හිමි වැඩ වාසය කරන ලද්දේ,
   i. දික්සඳ සෙනෙවියා පිරිවෙන
   ii. මරුගන පිරිවෙන
   iii. සුන්භාත පිරිවෙන
   iv. සුනේත්‍රා දේවි පිරිවෙන

2. පහත සඳහන් කරුණු අතරින් ප්‍රථම ඓතිහාසික යුගයේ ශ්‍රී ලංකාවේ මානව කටයුතුවල ප්‍රධාන වෙනස්කම් ඇතිවීමට හේතු වූ සාධකය වන්නේ,

   i. ආහාර පුලුස්සා කෑමට ගැනීම
   ii. සතුන් දඩයම් කර ආහාරයට ගැනීම
   iii. ගල් ගුහාවල ජීවත්වීම
   iv. යකඩ භාවිතය ආරම්භ වීම

3. ''එදා හෙළ දිව'' කෘතිය රචනාකල ඉංග්‍රීසි ජාතික ලේඛකයා වූයේ,
   i. විලියම් ග්‍රෙගරිය
   ii. රොබට් නොක්සස්ය
   iii. එච්.පී.බෙල්ය.
   iv. ලෙනාඩ් වුල්ෆ්ය.

4. සාහිත්‍ය මූලාශ්‍ර මගින් විස්තර කරන කාලයට පෙර තිබූ යුගය හැඳින්වෙන්නේ,
   i. පූර්ව ඓතිහාසික යුගය
   ii. ප්‍රාග් ඓතිහාසික යුගය
   iii. ඓතිහාසික යුගය
   iv. මුල් ඓතිහාසික යුගය

5. ශ්‍රී ලංකාවේ ගල් යුගයට අයත් සාක්ෂි හමුවන ඉරණමඩු සැකැස්මට අයත් ප්‍රදේශය වන්නේ,
   i. පහතරට වියළි කලාපයයි.
   ii. කඳුකර උස්බිම් සහිත ප්‍රදේශයයි.
   iii. තෙත් කලාපයේ මැටි සහිත ප්‍රදේශයයි.
   iv. අර්ධ ශුෂ්ක කලාපයේ මැටි හා බොරළු තට්ටුවයි

6. පහත සඳහන් විදේශීය ජාතිකයින් අතුරෙන් ශ්‍රී ලංකාවෙට පැමිණ ඇති තතු දැකබලා වාර්තා සැකසුමක් දැක්වෙන පිළිතුර වන්නේ,

A. - පාහියන් හිමි
B. - ප්ලිනි
C. - ඇරිස්ටෝටල්
D. - රිබෙයිරෝ
E. - ඉබන්බතූතා
F. - ටොලමි

i. A,B,C
ii. A,D,E
iii. A,E,F
iv. A,C,E

7. මෙරටින් හමු වී ඇති පැරණිතම කාසි හඳුන්වා ඇත්තේ,

i. තහාපණ
ii. රන්කාසි
iii. රන් කහවණුව
iv. මස්ස

8. ප්‍රාග් ඓතිහාසික මානවයා වාසය කළ පහතරට තෙත් කලාපීය එළිමහන් වාසස්ථානයක් වන්නේ,

i. පතිරාජවෙල
ii. හෝර්ටන්තැන්න
iii. බෙල්ලන්පැදිපැලැස්ස
iv. බටදොඹලෙන

9. මෙරට ශාසන ඉතිහාසයට මුල් තැනක් දෙමින් රචිත ග්‍රන්ථයක් වන්නේ,

i. පූජාවලිය
ii. සද්ධර්මාලංකාරය
iii. නිකාය සංග්‍රහය
iv. රාජාවලිය

10. ගල්වල කොටා ඇති ඉර, හඳ වටාපොත, හක්ගෙඩිය, වැනි පැරණි සලකුණුවලින් පෙන්වා ඇත්තේ,

i. නීති වර්ගයන්ය.
ii. ප්‍රාදේශීය මායිම්ය.
iii. ප්‍රදානයන් පිළිබඳවය.
iv. පුරා විද්‍යාත්මක ස්ථානයන්ය.

11. පෙර රජ දවස පරිපාලන සැකැස්මට අයත් වූ නිලධාරීන්

i. මහමත, මපුරුමුකා, අටෙක, බඩගරික
ii. මුරුමුකා, මහමත, අමෙත, බඩගරික
iii. මපුරුමුකා, ශෙනපති, මහමත,බඩගරික
iv. මපුරුමුකා, අමෙත, ශෙනපති, බඩගරික

12. වංසකතාවල හා සෙල්ලිපිවල පට්ටනගාම යනුවෙන් හඳුන්වා ඇත්තේ,

i. වාපිගම්මිය
ii. වෙළඳගම්මිය
iii. වරාය ආශ්‍රිත ගම්මිය
iv. ජනයා අතහැර දැමූ ගම්ය.

13. මීට අවුරුදු 38000කට බහත කාලයකදී ප්‍රාග් ඓතිහාසික මානවයාගේ වාසස්ථානයක්ව පැවති කලුතර දිස්ත්‍රිකක්යට අයත් ගල්ලෙන වන්නේ,

i. බටදොඹලෙන
ii. පාහින්ගල් ලෙන
iii. අලිගලලෙන
iv. කිතුල්ගල බෙලිලෙන

14. කුඩා වැව් පද්ධති භාරව කටයුතු කරන ලද්දේ,

i. දසගම් ඇත්තන්
ii. ගමික
iii. ගෘහපති
iv. පරුමක

15. සුමනගේ පවුලට අයත් ලෝහ වැඩ රැකියාව ලෙස කල ගෘහපතියෙකු භික්ෂූන් වහන්සේලාට ගල් ගුහාවක් පූජා කළ බව සඳහන් සෙල්ලිපිය වන්නේ,

i. පෙරියපුලියන්කුලම
ii. කලුදිය පොකුණ
iii. සිතුල්පව්ව
iv. කොත්ගල්කන්ද

16. තිස්සමහාරාම වැව, ඉදිකරවීමත් කිරිඳි ඔය හරස් කර අමුණක් බැන්දවීමත් සිදු කළ රජතුමා වූයේ,

i. මහසෙන් රජු
ii. වසඹ රජු
iii. ධාතුසේන රජු
iv. ඉලනාග රජු

17. අරාබි ජාතිකයින් ශ්‍රී ලංකාව හැඳින්වීමට භාවිතා කළ නාමය වන්නේ,

i. රතුකැට දිවයින
ii. තැප්‍රොබාන
iii. සෙයිලාන්
iv. සිලෝන්

18. ප්‍රාදේශීය පාලකයෙකු හැඳින්වීමට ''පොවනි'' රජ යනුවෙන් සඳහන් ව තිබූ සෙල්ලපිය පිහිටි ප්‍රදේශය වූයේ,

i. කොක් ඇබේ
ii. ඇඹුල් අඹේ
iii. වේවැල්කැටිය
iv. සිතුල්පව්ව

19. සිතුල්පව්ව,කොරවක්ගල සෙල්ලපියට අනුව භික්ෂූන් වහන්සේලාට ගල්ලෙනක් පිරිසිදු කර පූජා කළ ගම් නායකයෙකු නොවන්නේ,

i. ගමික සුමන
ii. ගමික සුතිල
iii. ගමික තිදත
iv. ගමික සිව

20. ගම් ප්‍රධානීන් පිළිබඳ ව දසගම් ඇත්තන් ලෙස හැඳින්වූ සෙල්ලිපිය වන්නේ?

i. තිරියාය
ii. කලුදිය පොකුණ
iii. දුනුමඩලාකන්ද
iv. වෙස්සගිරිය

21. තමන්ගේ දසවෙනි රාජ වර්ෂෙයේ දී දිවයිනේ ග්‍රාම සීමා සටහන් කිරීම සිදු කළ රජතුමා වූයේ,

i. පණ්ඩුකාභය රජු
ii. මහසෙන් රජු
iii. වසභ රජු
iv. දුටුගැමුණු රජු

22. වියළි කලාපයේ ජනතාව වැව් පද්ධතිය හැඳින්වූයේ,

i. එලලංගාව
ii. වාරි පද්ධතිය
iii. වැව් ප්‍රපතනය
iv. වැව් රැස

23. පැරණි අනුරාධපුර ග්‍රාමය පිහිටුවා තිබුණේ කුමන ගංගාව අසලද ?

i. කැළණි ගඟ
ii. මහවැලි ගඟ
iii. කලා ඔය
iv. මල්වතු ඔය

24. බටදොඹලෙන, පාහියන්ගල, බෙලිලෙන ආදි ස්ථාන වැදගත් වන්නේ,

i. පැරණි ජනාවාස ලෙස පැවතීම නිසාය.
ii. මෑතකදී කැණීම් කල නිසාය.
iii. ප්‍රාග් ඓතිහාසික මානවයා විසූ ලෙන් වීම නිසාය.
iv. ආරක්ෂිත ස්ථාන ලෙස පැවතීම නිසාය.

25. පුරාණ කාලයට අයත් සාහිත්‍ය ආගමික, තොරතුරු හා වංශ කතා ලියවී ඇත්තේ,

i. ගල් පුවරු මතය
ii. කටාරම්වලය
iii. රන් හා තඹ පත්වලය
iv. පුස්කොළ පොත්වලය.

26. ඉතිහාසය අධ්‍යයනය කිරීමේ දී අභිලේඛන යන කාණ්ඩයට අයත් වන්නේ,

i. තඹකාසි, රිදී කාසි, අන් කාසි ආදියේ ඇතුළත් ලේඛන
ii. මැටි පුවරු , තඹ තහඩු ආදියේ ලියා ඇති ලේඛන
iii. පුස්කොළ පොත්වල ලියූ ලේඛන
iv. ගිරි ලිපි, ටැම් ලිපි, ලෙන් ලිපි ආදිය

27. ශ්‍රී ලංකාව ජනාවාස වූයේ,

i. විජය කුමරු ඇතුලු ආර්ය කණ්ඩායමෙනි.
ii. ආදි කාලීන හෝමෝ සාපියන් මානවාගෙනි.
iii. විජායි කුමරිය ඇතුලු කණ්ඩායමෙනි.
iv. දකුණු ඉන්දියාවෙන් පැමිණි ද්‍රවිඩ ජනයාගෙනි.

28. ලංකාවේ විවිධ ප්‍රදේශවල සිදුකල පුරා විද්‍යාත්මක කැණීම්වලනි කාසි, ආභරණ, මැටි බඳුන් වැනි ද්‍රව්‍ය හමු වී ඇත. මේවා අධ්‍යයනය කිරීමෙන් බැස ගත හැකි නිගමනය වන්නේ,

i. ලෝහ භාණ්ඩ තැනීමට අවශ්‍ය අමුද්‍රව්‍ය තිබූ බවයි.
ii. දක්ෂ කැටයම් ශිල්පීන් සිටි බවයි.
iii. කාන්තාවන් රූ සපුව අලංකාරයට ආභරණ පපැළඳි බවයි.
iv. තාක්ෂණය විවිධ ක්ෂේත්‍ර ඔස්සේ පැතිරී තිබූ බවයි.

(ලකුණු - 28යි)